# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2017/36 - 2017 මැයි මස 05 වැනි සිකුරාදා - 2017.05.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78 (xiii)

### 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 140 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 18 වන වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදනු ලබන නියමාවලිය.

ලේකම්,
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

2017 මැයි මස 04 වැනි දින.

නියමාවලිය

1. මේ නියමාවලිය 2017 අංක 1 දරන වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන (සංශෝධන) නියමාවලිය යනුවෙන් හඳුන්වනු ලබන අතර ගැසට් පත්‍රයේ පළකරනු ලබන දින සිට එය බලාත්මක විය යුතු ය.

2. 2014 ජූලි 30 දින අංක 1873/16 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළකරනු ලැබූ නියමාවලිය මගින් අවසන් වරට සංශෝධිත 1980 අප්‍රේල් 10 දින අංක 83/7 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළකරනු ලැබූ 1980 අංක 1 දරන වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

(1) එහි 13 වන ඡේදයෙහි -

(i) එම ඡේදයේ (අඒ) අයිතමයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් අයිතමය එකතු කිරීමෙන් :-

''(අඔ) විකලාංග ශල්‍ය වෛද්‍ය වේදය''

(2) එහි 25 වන ඡේදයෙහි -

(i) ''වෛද්‍ය විද්‍යාවේ විශේෂඥ ක්ෂේත්‍රය'' යන යෙදුමේ අර්ථ නිරූපනයෙහි ''කාම ව්‍යාධි වේදය හෝ වෙනත් යම් විශේෂඥ ක්ෂේත්‍රයක්'' යන වචන වෙනුවට ''කාම ව්‍යාධි වේදය, විකලාංග ශල්‍ය වෛද්‍ය වේදය හෝ වෙනත් යම් විශේෂඥ ක්ෂේත්‍රයක්'' යන වචන ආදේශ කිරීමෙන්.

05 - 577

1A - PG 3514 — 107 (2017/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*